# PUBLIC ECONOMY
# (Part-VI)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# රාජ්‍ය අයවැය ලේඛනය

ඉදිරි වර්ෂය තුළ රජයේ කටයුතු සඳහා දැරීමට අපේක්ෂිත වියදමත් එකී වියදම් පියවා ගැනීම සඳහා මුදල් සපයා ගන්නා මාර්ගත් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර සම්මත කර ගන්නා වාර්තාව රාජ්‍ය අයවැය ලේඛනය වේ.

එය ආණ්ඩුවේ ඉදිරි මුදල් සැලැස්ම වන අතර ආණ්ඩුවක ඉදිරි දැක්ම හා ක්‍රියාමාර්ග පිළිබිඹු කරන වැදගත් ලියවිල්ලක් ලෙස ද සඳහන් කළ හැකි ය.

රාජ්‍ය අයවැය ලේඛනය හා සම්බන්ධව විසර්ජන කෙටුම්පත නමින් පණතක් පවතී.

ClassWork.LK

## විසර්ජන කෙටුම්පත

විසර්ජන කෙටුම්පත යනු ඉදිරි වර්ෂය සඳහා දැරීමට අපේක්ෂිත වියදම් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ වශයෙන් වෙන් කොට, ලබා ගැනීම අපේක්ෂා කරන අය මාර්ග සඳහන් කොට ආදායම් වියදම් අතර පරතරයක් පවතී නම් එය මූල්‍යනය කරන ආකාරයත් දැක්වෙන කෙටුම්පතකි.

## පරිපූරක ඇස්තමේන්තුව

විසර්ජන පණත සම්මත වූවාට පසුවත් කිසියම් අමාත්‍යාංශයට අලුතින් මුදල් අවශ්‍යතාවක් පැන නැඟුණු විට ඒ සඳහා පාර්ලිමේන්තු අනුමතිය ලබා ගැනීමට අදාළ ඇමතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන ඇස්තමේන්තුව පරිපූරක ඇස්තමේන්තුව නමින් හැඳින්වේ.

ClassWork.LK

# <u>අතුරු සම්මත ගිණුම</u>

කිසියම් අනපේක්ෂිත සිදුවීමක් නිසා (යුධමය තත්ත්ව, මැතිවරණ වැනි) නියමිත කාලයට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට සම්මත කර ගැනීමට අපොහොසත් වන අවස්ථාවක එය සම්මත කර ගන්නා තෙක්, ඉදිරි මුදල් වර්ෂය සඳහා ඒ ඒ අමාත්‍යාංශ විසින් දැරිය යුතු වියදම් රජයේ ඒකාබද්ධ අරමුදලින් වෙන් කර ගැනීම සඳහා තාවකාලික වශයෙන් ඉදිරිපත් කළ යුතු වැය ලේඛනය අතුරු සම්මත ගිණුම නමින් හැඳින්වේ.

අතුරු සම්මත ගිණුමෙහි දැක්වෙන්නේ වැය යෝජනා පමණක් හෙයින් එහි අතිරික්තයක් හෝ හිඟයක් හෝ නොමැත.

එසේ ම අතුරු සම්මත ගිණුම මාස 03ක් හෝ 04ක් වැනි කෙටි කාලයක් සඳහා ඉදිරිපත් වන්නක් වන අතර අලුත් ප්‍රතිපත්ති ව්‍යාපෘති කිසිවක් එහි ඇතුළත් නොවේ.

ClassWork.LK

# අතුරු අයවැය

අතුරු අයවැයක් යන්න අතුරු සම්මත ගිණුමෙන් වෙනස් වූවකි.

අතුරු අයවැයක් යනු වැය යෝජනා පමණක් නොව අය යෝජනා ද ඇතුළත් සම්පූර්ණ අයවැය ලේඛනයකි.

අතුරු අයවැයක් ලෙස හඳුන්වන්නේ, එක් ආණ්ඩුවක් බලයට පත් ව සිටිය දී ඉදිරිපත් කරන ලද අයවැය ලේඛනය සම්මතව තිබිය දී ඊට පසුව බලයට පත් වන ආණ්ඩුවක් තමන්ට අවශ්‍ය සංශෝධන ඇතුළත් කොට නැවත ඉදිරිපත් කරන අයවැය ලේඛනයකි.

ClassWork.LK

## රාජ්‍ය අය වැය ලේඛණයක් සහ පෞද්ගලික අයවැය ලේඛණයක් අතර වෙනස

රාජ්‍ය අයවැය ලේඛණයක් සහ පෞද්ගලික අය වැය ලේඛණයක් අතර වෙනසක් පවතී.

පෞද්ගලික අයවැය ලේඛනයක දී පළමු ව අය මාර්ග සඳහන් කොට ඒ අනුව වියදම් සැලසුම් කරති.

එහෙත් රාජ්‍ය අයවැය ලේඛනයකදී පළමුව දැරීමට අපේක්ෂිත වියදම් ඇස්තමේන්තු කොට පසුව එම වියදම් පියවා ගැනීම සඳහා අවශ්‍ය අය මාර්ග තීරණය කරයි.

ClassWork.LK

<u>ප්‍රධාන අයවැය සංකල්ප</u>

රාජ්‍ය අය වැය ලේඛනයකදී ද රාජ්‍ය ආදායම් හා රාජ්‍ය වියදම් ගැළපීමෙන් අයවැය ශේෂය ලබා ගන්නා අතර එම අය වැය ශේෂයෙහි ස්වභාවය අනුව,

ප්‍රධාන අයවැය සංකල්ප තුනක් හඳුනා ගත හැකි ය.

- හිඟ අයවැය
- අතිරික්ත අයවැය
- තුලිත අයවැය

Class Work.LK

## හිඟ අයවැය

රාජ්‍ය ආදායමට වඩා රාජ්‍ය වියදම වැඩි නම් එය හිඟ අයවැයකි.

## අතිරික්ත අයවැය

රාජ්‍ය ආදායමට වඩා රාජ්‍ය වියදම අඩු නම් එය අතිරික්ත අයවැයකි.

## තුලිත අයවැය

රාජ්‍ය ආදායම් හා රාජ්‍ය වියදම් සමාන මට්ටමක පවතී නම් එය තුලිත අයවැය තත්ත්වයකි.

ClassWork.LK

**කල්පිත දත්ත** ඇතුළත් රාජ්‍ය අයවැය ලේඛනයක ආකෘතියක් පහත දැක්වේ.

| ශීර්ෂය | රුපියල් මිලියන |
|---|---|
| මුළු ආදායම හා ප්‍රදාන | 170,000 |
| මුළු ආදායම | 165,000 |
| බදු ආදායම | 150,000 |
| බදු නොවන ආදායම | 15,000 |
| ප්‍රදාන | 5,000 |
| වියදම් හා ආපසු ගෙවීම් අඩු කළ පසු ණය දීම් | 200,000 |
| පුනරාවර්තන (පොළී ගෙවීම් 21 000) | 175,000 |
| ප්‍රාග්ධන හා ශුද්ධ ණය දීම් (රාජ්‍ය ආයෝජන 20,000) | 25,000 |
| වර්තන ගිණුමේ අතිරිත්කය / හිඟය (-) | -10,000 |
| ප්‍රාථමික ගිණුමේ අතිරික්තය / හිඟය (-) | - 9,000 |
| සමස්ත අයවැය අතිරික්තය / හිඟය (-) | - 30,000 |

ClassWork.LK

# රාජ්‍ය අයවැයක ස්වභාවය පරීක්ෂා කිරීමේ මිනුම්

රාජ්‍ය අයවැයක ස්වභාවය පරීක්ෂා කිරීම සඳහා යොදා ගත හැකි මිනුම් කිහිපයකි.

ඒවා නම්

- වර්තන ගිණුමේ ශේෂය
- සමස්ත ගිණුමේ ශේෂය
- ප්‍රාථමික ගිණුමේ ශේෂය
- ශුද්ධ මූල්‍ය හිඟය

ClassWork.LK

## වර්තන ගිණුමේ ශේෂය

වර්තන ගිණුමේ ශේෂය යන්නෙන් අදහස් වන්නේ ආණ්ඩුවේ මුළු අයහාරයෙන් (ප්‍රදාන ලැබීම් හැර) පුනරාවර්තන (වර්තන) වියදම් අඩු කළ පසු ඉතිරි වන ශේෂයයි.

ඉහත අයවැය ආකෘතියට අනුව

| | |
|---|---|
| මුළු ආදායම | = 165,000 |
| පුනරාවර්තන වියදම් | = 175,000 |
| වර්තන ගිණුමේ ශේෂය | = 165,000 - 175,000 |
| | = -10,000 |

ClassWork.LK

ClassWork.LK

## සමස්ත ශේෂය

සමස්ත ශේෂය යන්නෙන් අදහස් වන්නේ ආණ්ඩුවේ මුළු අයභාරයෙන් (ප්‍රදාන ලැබීම් ඇතුළුව) පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම්වලින් සමන්විත ආණ්ඩුවේ මුළු වියදම් අඩු කළ පසු ඉතිරි වන ශේෂය යි.

| | |
|---|---|
| මුළු අයභාරය | = 170,000 |
| වියදම් හා ආපසු ගෙවීම් අඩු කළ පසු ණය දීම් (මුළු වියදම්) | = 200,000 |
| සමස්ත ශේෂය | = 170,000 - 200,000 |
| | = - 30,000 |

## ප්‍රාථමික ගිණුමේ ශේෂය

ප්‍රාථමික ගිණුමේ ශේෂය යන්නෙන් අදහස් වන්නේ ආණ්ඩුවේ මුළු අයභාරයෙන් (ප්‍රදාන ලැබීම් ඇතුළුව) රාජ්‍ය ණය සඳහා ගෙවූ පොළී වියදම් ඇතුළත් නොවූ පුනරාවර්තන වියදමත්, ප්‍රාග්ධන වියදමත් යන සංරචක දෙකින් සමන්විත වූ ආණ්ඩුවේ වියදම් අඩු කළ පසු ඉතිරි වන ශේෂය යි)

සමස්ත ශේෂයෙන් පොළී ගෙවීම් අඩු කිරීම තුළින්ද ප්‍රාථමික ගිණුමේ ශේෂය ලබා ගත හැකි ය.

ප්‍රාථමික ගිණුමේ ශේෂය = සමස්ත ගිණුමේ ශේෂය - පොළී ගෙවීම්

ප්‍රාථමික ගිණුමේ ශේෂය = -30,000 -(-21,000) = -9,000

ClassWork.LK

මේ නිසා සමස්ත ගිණුමේ ශේෂය සහ ප්‍රාථමික ගිණුමේ ශේෂය අතර වෙනස රාජ්‍ය ණය සඳහා ගෙවූ පොලී වියදම්වලට සමාන වේ.

ඉහත ආකෘතියට අනුව

| | |
|---|---|
| සමස්ත ගිණුමේ ශේෂය | = -30,000 |
| ප්‍රාථමික ගිණුමේ ශේෂය | = -9,000 |
| පොලී ගෙවීම් | = -30, 000 - (-9,000) |
| | = -21 000 |

ClassWork.LK

## ශුද්ධ මූල්‍ය හිඟය

ශුද්ධ මූල්‍ය හිඟය යන්නෙන් අදහස් වන්නේ ආණ්ඩුවේ මුළු අයභාරයෙන් (ප්‍රදාන ලැබීම් ඇතුළු ව) ණය වාරික ආපසු ගෙවීම් අඩු කළ පසු රජයේ මුළු වියදමත් අතර වෙනස යි (එනම්, ණය වාරික ආපසු ගෙවීම් ඇතුළත් නොකොට ගණනය කරනු ලබන අය වැය හිඟය යි).

**නිදසුන් :**

| | |
|---|---|
| මුළු අයභාරය<br>(දීමනා ලැබීම්ද ඇතුළුව) | = රු.මි. 5 000 |
| රජයේ මුළු වියදම් | = රු.මි. 6 100 |
| සමස්ත අයවැය ශේෂය | (රු.මි. 5 000 - 6 100) |
| | රු.මි. - 1 100 |
| ණය වාරික ආපසු ගෙවීම් | = රු.මි. 500 |
| ශුද්ධ වූ මූල්‍ය හිඟය | = - 1 100 - (-500) |
| | = රු.මි. - 600 |

ClassWork.LK

මේ අනුව රජයේ ශුද්ධ මූල්‍ය හිඟය සහ සමස්ත අයවැය ශේෂය අතර වෙනස වන්නේ ණය වාරික ආපසු ගෙවීම් ය.

ආණ්ඩුවේ වියදම් පිළිබඳ ආර්ථික වර්ගීකරණයට අනුව රාජ්‍ය ණය වාරික ආපසු ගෙවීම් ආණ්ඩුවේ ප්‍රාග්ධන වියදමට ඇතුළත් නොකෙරේ.

එයට හේතුව එම වියදම අදාළ වර්ෂයේ කරන ලද වියදමක් හේතු කොට ගෙන හටගත් ගෙවීමක් නොවීම නිසාය.

එහෙත් ආණ්ඩුවේ වියදම ගිණුම්කරණ ප්‍රවේශය ඔස්සේ සටහන් කිරීමේ දී දේශීය හා විදේශීය ණය වාරික ආපසු ගෙවීමේ ප්‍රාග්ධන වියදම් යටතේ ඇතුළත් කෙරේ.

මේ නිසා ශුද්ධ මූල්‍ය හිඟය ගණනය කිරීම සඳහා සමස්ත අයවැය ශේෂයෙන් ණය වාරික ආපසු ගෙවීම් අඩු කරනු ලැබේ.

ClassWork.LK

# රාජ්‍ය අයවැය ප්‍රතිපත්ති

රාජ්‍ය අයවැය ප්‍රතිපත්ති ස්වරූප දෙකකි.

- ප්‍රසාරණාත්මක අයවැය ප්‍රතිපත්ති
- සංකෝචනාත්මක අයවැය ප්‍රතිපත්ති

ClassWork.LK

# ප්‍රසාරණාත්මක අයවැය ප්‍රතිපත්ති

අයවැය හිඟය පියවීමට ලබා ගන්නා රාජ්‍ය ණය මගින් රටේ මුදල් සැපයුම වැඩි වී මිල මට්ටම් ඉහළ යාම තුළින් උද්ධමනාත්මක තත්ත්වයක් ඇති වේ නම් එය ප්‍රසාරණාත්මක අයවැය ප්‍රතිපත්තියක් ලෙස සැලකේ.

**නිදසුන :**

රජය මහ බැංකුවෙන් ණය ලබා ගැනීම

රජය වාණිජ බැංකුවලින් ණය ලබා ගැනීම

රජයක් මහ බැංකුවෙන් හා වාණිජ බැංකුවලින් ණය ලබාගෙන අයවැය හිඟය පියවීමේදී රටේ මුදල් සැපයුම ප්‍රසාරණය වේ.

මේ නිසා සමස්ත ආදායමට වඩා සමස්ත වියදම ඉහළ ගොස් උද්ධමනාත්මක තත්ත්වයක් හට ගනී.

ClassWork.LK

# සංකෝචනාත්මක අයවැය ප්‍රතිපත්ති

අයවැය ලේඛනයේ හිඟය පියවා ගැනීම සඳහා ලබා ගන්නා රාජ්‍ය ණය මගින් මුදල් සැපයුමෙහි වැඩි වීමක් සිදු නොවේ නම් එය සංකෝචනාත්මක අයවැය ප්‍රතිපත්තියක් ලෙස සැලකේ.

- ✓ ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ණය ලබා ගැනීම
- ✓ සේවක අර්ථ සාධක අරමුදලෙන් ණය ලබා ගැනීම
- ✓ මහජනතාවගෙන් ණය ලබා ගැනීම

මෙවැනි ණය ලබා ගැනීම තුළින් රටේ මුදල් සැපයුමෙහි වැඩිවීමක් සිදු නොවේ. එහිදී එම ආයතන හෝ පුද්ගලයින් හෝ සතුව පවතින මුදල් ප්‍රමාණයක් රාජ්‍ය ණය වශයෙන් ලබාදීම සිදු වේ.

මේ නිසා උද්ධමනකාරී තත්ත්වයක් හට නොගනී.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura